**සමාගමේ නම**

**[සමාගමේ නම] යන සමාගමේ 2012 ............... මස .......... දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල සහතිකකල උද්ධෘතය.**

සමාගම සහ බැංකුව අතර ඇතුලත්වීමට නියමිත ප්‍රධාන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුමේ අන්තර්ගත නියම හා කොන්දේසි යටතේ ................................ ලිමිටඩ් (සමාගම) විසින් අංක. 40, නවම් මාවත, කොළඹ 02 යන ලිපිනයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය (බැංකුව) සමග ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනුවකට හෝ ප්‍රත්‍යාවර්තන ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනුවකට ඇතුලත්වන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලබන අතර ඒ අනුව සමාගම විසින් මෙයින් පහත දැක්වෙන පරිදි යෝජනා සම්මතකර සිටිනු ලැබේ; එනම්

(අ) මේ සමග සම්බන්ධකර ඇති ආකෘතියෙන් හෝ (මෙහි මින්මතු අර්ථනිරූපනය කර ඇති) අවසරලත් අත්සන්කරුවන් විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් යම් ආකෘතියකින් වූ ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම ලියාඅත්සන් කිරීම සහ බැංකුව වෙත භාරදීම මෙන්ම එකී ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුමට ඇතුලත්වීම සහ එය බලාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා අවශ්‍යවන ඕනෑම ස්වභාවයක හෝ විස්තරයක සියලු සාධන පත්‍ර සහ ලේඛන ලියාඅත්සන් කිරීම සහ බැංකුව වෙත භාරදීම මෙන්ම බැංකුව සමග ඇතුලත්වීමට නියමිත ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනු සම්බන්ධයෙන් හෝ ප්‍රත්‍යාවර්තන ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනු සම්බන්ධයෙන් අවසරලත් අත්සන්කරුවන් සහ බැංකුව අතර අන්‍යෝන්‍ය වශයෙන් එකඟවිය හැකි වෙනත් යම් ලේඛන ලියාඅත්සන් කිරීම සහ බැංකුව වෙත භාරදීම සමාගම විසින් අනුමතකර සිටිනු ලැබේ;

(ආ) සමාගම විසින් එකී ප්‍රධාන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුමට අත්සන්කිරීම සඳහා (මෙහි මින්මතු අවසරලත් අත්සන්කරුවන් යනුවෙන් සඳහන් කරනු ලබන) පහත සඳහන් එක් තැනැත්තකුට/ තැනැත්තන් දෙදෙනකුට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් බලය පවරා සිටිනු ලැබේ.

අ. ..............................................................................

ආ. ................................................................................

(ඇ) බැංකුවට පිළිගත හැකි ආකාරයෙන් සමාගම විසින් එකී අවසරලත් අත්සන්කරුවන්ගේ ආදර්ශක අත්සන් බැංකුව වෙත ලබාදීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය;

(ඈ) අවසරලත් අත්සන්කරුවන් විසින් -

අ. ඉහත (අ) ඡේදයේ විස්තරකර ඇති ලේඛනවල සඳහන් නියම හා කොන්දේසි මත ගණුදෙනුකිරීම සමාගම විසින් අනුමත කරනු ලැබේ.

ආ. ඉහත විස්තරකර ඇති ලේඛනවල යම් වෙනස්කම් සිදුකිරීම සමාගම විසින් අනුමත කරනු ලැබේ.

ඇ. කලින්කල ප්‍රධාන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම ප්‍රකාරව ඇතුලත්වන ඉහත විස්තර කර ඇති ප්‍රතිමිලදීගැනීම් ගණුදෙනුවකට හෝ ප්‍රත්‍යාවර්තන ප්‍රතිමිලදීගැනීම් ගණුදෙනුවකට අදාල ලිඛිත උපදෙස් බැංකුව වෙත ලබාදීම සමාගම විසින් අනුමත කරනු ලැබේ.

ඉහතකී ප්‍රධාන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමට නිසි බලය පවතින බවටත් ඒ යටතේ වූ සියලු වලකීම් ඉටු කිරීමේ හැකියාව පවතින බවටත් සමාගම විසින් එම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා, භාරදීම සඳහා සහ ඒ යටතේ ක්‍රියාකිරීම සඳහා බලය පැවරීමට අවශ්‍ය සියලු අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු බවටත් මෙයින් තවදුරටත් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

**අධ්‍යක්ෂමණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනා සම්මතයේ සහතිකකල උද්ධෘතය**

**අධ්‍යක්ෂ** **අධ්‍යක්ෂ**